**ශීර්ෂය 116 වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 116 - වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූලි 19 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට  වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ  වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය  ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වෙළඳ අමාත්‍යාංශයට පැවරුම් කරන ලද රු. 2,157,470 ක් වූ මෝටර් රථයක් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | රු. 2,157,470 ක් වටිනා මෝටර් රථය පිළිබඳ තොරතුරු මුදල් අංශයට 2021 දෙසැම්බර් 31 දින වන විට නොලැබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ එම අගය එකතු කර නොමැති අතර 2023 වර්ෂයේ නිවැරදි කිරීම සඳහා කටයුතු කිරීමට සටහන් කර ගෙන ඇත. | අමාත්‍යාංශයට අයත් වත්කම් නිසි ලෙස ගිණුම්ගත කල යුතුය. |

**(ආ) විගණන සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල අමාත්‍යාංශයට ඒකාබද්ධ වූ රාජ්‍ය අමාත්‍යාංශයට අයත් වාහන 02 ක් වශයෙන් සලකා රු.15,940,000 ක වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයේ (CIGAS වාර්තාවේ) ඇතුලත් කර තිබුණ ද, එය රාජ්‍ය අමාත්‍යාංශයට අයත්ව තිබූ බවට තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය. | අදාළ වාහන ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය සතු වාහන වන අතර මේ වන විට පවරා ගැනීමට අදාල කටයුතු සිදු කරමින් පවතී. | රාජ්‍ය අමාත්‍යාංශයට අයත්ව තිබූ බවට තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි පැවතිය යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 07 ක් සඳහා පරිපූරක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණද ඒවායේ ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 48 ක සිට සියයට 100 ක් | අදහස් දක්වා නොතිබුණි. | අවශ්‍යතාවය හරියාකාරව නිර්නය කිරීමෙන් පසුව පරිපූරක ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතුය. |

අතර පරාසයක පැවතුණි. තවද මින් සියයට සියයක් ඉතිරිවීම් පැවති 116-01-01-2001 දරන වැය විෂය සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදනයක් නොතිබුණු අතර පරිපූරක ප්‍රතිපාදන මගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණි.

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂය 116-01-02-1409 යටතේ ඉතිරිය ඉක්ම වූ බැරකම් රු. 531,168 ක් පැවති අතර මේ සම්බන්ධයෙන් මු.රෙ. 94 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාළ වැයවිෂයන් යටතේ දෙසැම්බර් මාසයේ බිල්පත් ඊළඟ වසර ජනවාරි මාසයේදී ඉදිරිපත් වන බැවින් නියමිත ගිණුම් වර්ෂයේ ප්‍රතිපාදන ඉක්මවා බැදීම් ඇති වුවද, වර්ෂය තුළ ප්‍රතිපාදන ඉක්මවා නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 1646 | සෑම වාහනයක් සඳහාම ධාවන සටහන් ඊළඟ මාසයේ 15 දිනට පෙර ඉදිරිපත් කලයුතු වුවද සමාලෝචිත වර්ෂයේදී සංචිත වාහන 07 ක් සඳහා මාස 21 ක ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මින් වාහන 04 ක් මාණ්ඩලික නිලධාරීන් වෙත අනුයුක්ත කර තිබූ අතර අමාත්‍යාංශයේ සංචිත රියදුරන් සඳහා දෛනික ධාවන සටහන් අදාළ මාසය වෙනුවෙන් නිසියාකාරව දිනපතා සම්පූර්ණ කරන ලෙස දැනුවත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/ 2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල පමාවකින් පසුව හා කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හා එන්ජිමට සම්බන්ධ | සමාලෝචිත වර්ෂයේ හා ඊට පෙර වර්ෂයන් වල පැවති කොරෝනා වසංගතයත් සමඟ රටෙහි ඇති වූ ආර්ථික අර්බුද හේතුවෙන් උග්‍ර ඉන්ධන හිඟයන් සහ ඉන්ධන | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින් යෙදෙන අවස්ථාවට පසුව නැවත පරීක්ෂා කලයුතු වුවත් 2022 වසර තුල හෝ ඊට පෙර වෙළඳ අමාත්‍යාංශයේ සංචිත වාහන 7 ක් සඳහා ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | ලබා ගැනීම සඳහා පැවැති පෝලිම් ක්‍රමය සහ QR කේත ක්‍රමය මත උපරිම ලීටර් 20 සතියකට ලබා දීම හේතුවෙන් ඉන්ධන පරීක්ෂාවන් සිදු නොකරන ලදී. 2023 වර්ෂයේ සංචිත වාහන සඳහා ඉන්ධන පරීක්ෂාවන් සිදු කර ඇත. | |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය | ඉදිරි වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කර ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන එහි පිටපත් අදාල ආයතන වෙත යොමුකල යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාල වෙළඳ අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන සැලැස්ම සම්බන්ධයෙන් ඒ අයුරින් කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා අදාළ ප්‍රසම්පාදන සැලැස්ම 2023 ජනවාරි 04 දින අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කොට ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.4 අවිධිමත් ගනුදෙනු

### (අ) අධිකාර බලය නොමැති ගෙවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2020 මැයි 12 දින සිට 2021 මාර්තු 22 දින දක්වා අමාත්‍යාංශ ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් ලෙස පත්ව සිටි නිලධාරීන් දෙදෙනෙක් වෙත මාසික වැටුප්, ඉන්ධන හා ප්‍රවාහන දීමනා ලෙස පිළිවෙලින් රු. 1,258,526 ක් හා රු. 1,564,328 ක මුදලක් ගෙවා තිබුණද සේවයට වාර්තා කිරීම සම්බන්ධයෙන් පැමිණීම්, පිටවීම් පිළිබඳ ලේඛන වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණි. | අමාත්‍යාංශ ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්වරුන් ලෙස කටයුතු කළ නිලධාරීන් දෙදෙනාගේ පැමිණීමේ හා පිටවීමේ ලේඛන ලබාදෙන ලෙස දන්වා ඇතත් එම ලේඛන පාලන අංශය වෙත ලබාදී නොමැත. | පැමිණීම්, පිටවීම් ලේඛන හා කාර්යසාධන වාර්තා අනුව ගෙවීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | අංක KR 1491 දරන සංචිත වාහනය සඳහා සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ ඉන්ධන ලබාදී තිබුණද එම වාහනයට අදාලව ධාවන සටහන් ලැබී තිබුණේ මාස 07 ක අදාළව පමණි. විගණනයට ඉදිරිපත් කල ධාවන සටහන්වල අඩංගු විස්තර අනුව එම වාහනය එම කාලය තුල ලේකම්තුමියගේ නිල නිවස හා ලේකම්තුමියගේ රාජකාරී සඳහා යොදවා ගෙන තිබූ අතර 2021 දෙසැම්බර් 29 දිනැති අංක 13/2008/(VI) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව මසකට අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණය සඳහා අදාල මාසික ඉන්ධන දීමනාව වූ රු. 26,620 ක් ලබා ගනිමින් සිටියදී සංචිත වාහනය සඳහා ඉන්ධන ඇණවුම් මඟින් රු. 156,470 ක පෙට්‍රල් ලීටර් 1,006 ක ප්‍රමාණයක් ලේකම්තුමියගේ රාජකාරී සඳහා නැවත ලබාදී තිබුණි. | ඉදිරියේදී මේ සඳහා පිළිතුරු ලබා දීමට කටයුතු කරනු ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිලධාරින් 02 දෙනෙක් අවස්ථා දෙකකදී එකතුව රු. 135,000 ක් වටිනා අත්තිකාරම් ලබාගෙන තිබුණද අත්තිකාරම් ලබාගත් අවශ්‍යතාවය ඉටු නොකර ලබා දුන් මුදල නැවත පියවීම සඳහා දින 09 ක් හා දින 36 ක් අතර සැලකියයුතු කාලපරාසයක් ගතකර තිබුණි. | ඉදිරියේදී අත්තිකාරම් මුදල් ලබා ගැනීමෙන් පසු ප්‍රමාදයකින් තොරව පියවීම සඳහා කාර්ය මණ්ඩලය ලිඛිතව දැනුවත් කර ඇත. | මුදල් රෙගුලාසි) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

අමාත්‍යාංශයේ අරමුණු අතුරින් පහත දැක්වෙන ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් තුලින් දේශීය නිෂ්පාදකයින් හා පාරිභෝගික අයිතීන් සුරකෙන පරිදි වෙළඳපොල හැසිරීම පාලනය සඳහා මෙවලමක් ලෙස තීරුබදු ප්‍රතිපත්තිය යොදා ගැනීම හා නිෂ්පාදනයන් දිරිමත් කිරීම සඳහා දේශීය නිෂ්පාදකයින් සඳහා බදු සහන ලබාදීම තුලින් අපනයනය දිරිමත් කිරීම. | දේශීය නිෂ්පාදකයින් හා පාරිභෝගික අයිතීන් සුරකෙන පරිදි වෙළෙඳපොළ හැසිරීම පාලනය සඳහා තීරු බදු ප්‍රතිපත්තිය යොදා ගැනීම හා බදු සහන ලබා දීම රජය විසින් ගනු ලබන මූල්‍ය ප්‍රතිපත්ති මත මුදල් අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබන අතර රජය ක්‍රියාත්මක කරනු ලබන බදු සහන මත පදනම්ව දේශීය නිෂ්පාදකයන් දිරිමත් කිරීම සඳහා බදු සහන ලබා දීම හා අදාල දැනුවත් කිරීමේ වැඩසටහන්, පුහුණු වැඩසටහන් සහ අපනයන ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මත කිරීම අපනයන සංවර්ධන මණ්ඩලය විසින් නිරන්තරව සිදු කර ඇති අතර පාරිභෝගික අයිතීන් සුරකෙන පරිදි වෙළෙඳපොළ හැසිරීම පාලනය සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු අධිකාරීය විසින් කටයුතු කර ඇත.<br>ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් තුළින් ඉහත කරුණු සාක්ෂාත් කිරීම සඳහා වෙළෙඳ අමාත්‍යාංශය විසින් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාල දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම, එම දත්ත පද්ධති යාවත්කාලීන කිරීම හා එම දත්ත බාහිර තොරතුරු සපයන ආයතන සමඟ සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණය සැකසීම. | එම දත්ත පද්ධතිය සතස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. | ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම මඟින් ඉටුකර ගැනීම සඳහා සැලසුම් කල ප්‍රධාන කාර්යයක් වූ ශ්‍රී ලංකාව තුල මෙට්‍රික් ටොන් 8000 ක ආරක්ෂක සහල් සංචිතයක් පවත්වා ගැනීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 50 ක් හා පෙර වර්ෂයේ රු. මිලියන 200 ක් ප්‍රතිපාදන ලෙස ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණද මේ සම්බන්ධ කිසිදු කාර්යයක් සමාලෝචිත වර්ෂයෙත් පෙර වර්ෂයෙත් ඉටු වී නොතිබුණි. තවද මේ සම්බන්ධව අමාත්‍යාංශයේ අධීක්ෂණ කාර්යයද නිසි ලෙස සිදු වී නොතිබුණි. | ආරක්ෂිත සහල් තොගය තබා ගැනීම සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ රු.මිලියන 200 ක ප්‍රතිපාදන භාවිතා කරමින් රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව මගින් සහල් ආනයනය කරවා සතොස හරහා රට පුරා බෙදාහැරීම් කරන ලදී. ඒ තුළින් රට තුළ සහල් සුලභතාවය ඇති කර සහල් මිල පාලනය සඳහා ක්‍රියාකාරී දායකත්වයක් දක්වන ලදී.<br>2022 වර්ෂයේ මෙට්‍රික් ටොන් 8000ක ආරක්ෂිත සහල් තොග පවත්වා ගැනීම සඳහා අයවැය ප්‍රතිපාදන මගින් රු. මිලියන 50ක ප්‍රතිපාදන ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත වෙන් කර තිබුණි. නමුත් මෙට්‍රික් ටොන් 8000ක ආරක්ෂිත සහල් තොග පවත්වා ගැනීම සඳහා මෙම රු. මිලියන 50 ක ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රමාණවත් නොවන හෙයින්, එම මුදල් වැය කිරීමට නොහැකි විය. තවද අයවැය චක්‍රලේඛ 3/2022 අනුව වියදම් සීමා කිරීම නිසාද මෙලෙස ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | අමාත්‍යාංශය විසින් අධීක්ෂණ කාර්යභාරය නිසි පරිදි ඉටු කළ යුතුය. |
| (ආ) | මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල යටතේ මිහින්තලේ විසල් වෙළඳ නගර ව්‍යාපෘතිය,නුවරඑළිය ජෛව පද්ධති තාක්ෂණ විශ්වවිද්‍යාලය සහ විදේශ භාෂා විශ්ව විද්‍යාලය ස්ථාපිත කිරීම යන ව්‍යාපෘති 3 ආරම්භ කිරීම සිදු කල යුතු බවට අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා තිබුණු නමුත් ව්‍යාපෘතියට අදාල ඉඩම් පවරා නොදීම සහ අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතිය නොලැබීම මත මහපොළ භාරකාර මණ්ඩලයේ තීරණය ප්‍රකාරව මෙම ව්‍යාපෘති අත්හැර දමා තිබුණි. තවද මිහින්තලේ විසල් වෙළඳ නගර ව්‍යාපෘතිය සඳහා අදාල මූලික කටයුතු වෙනුවෙන් රු.1,770,000 ක මුදලක්ද වැය කර තිබුණි. | දැනට පවතින අරමුදලේ මූල්‍ය තත්වය යටතේ, ලලිත් ඇතුලත් මුදලි මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදලේ මුදල් ප්‍රාග්ධන ආයෝජන සඳහා යෙදවීම අත්හිටුවන ලෙස රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති අතර එය 2022 ඔක්තෝබර් 25 වන දින පැවති අමාත්‍ය මණ්ඩලය විසින් නිර්දේශ කොට ඇති බැවින් මෙම ව්‍යාපෘතීන් අත්හිටුවීමට භාරකාර මණ්ඩලය තීරණය කොට ඇත. | වියදම් දැරීමට පෙර ඉඩම් පවරාගැනීම් හා අදාළ අනුමැතීන් ලබාගත යුතුය. |

## 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමූපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් ගබඩා 13 ක් නවීකරණය කිරීම | | |
| (i) රු. 22,500,000 ක ඇස්තමේන්තුවක් සහිත මෙම ව්‍යාපෘතිය සඳහා 2021 දී අමාත්‍යාංශය විසින් රු. 50,000,000 ක ප්‍රතිපාදන ලබාදී තිබිණි. සමූපකාර තොග වෙළඳ සංස්ථාව විසින් ගබඩා 13 ක් නවීකරණය සඳහා රු. 82,525,681 ක් වැයකර තිබූ අතර අමාත්‍යාංශය විසින් 2020 දෙසැම්බර් 31 දිනට රු. 62,490,367 ක වියදම ප්‍රතිපූර්ණය කර තිබිණි. 2020 වර්ෂය තුල මෙම ගබඩා සියල්ලෙහිම නවීකරණ කටයුතු නිම විය යුතු වුවත් 2023 මැයි 16 වනතෙක් ගබඩා 04 ක කටයුතු නිම වීමේ ප්‍රගතිය සියයට 5 ක සිට 65 ක් අතර පරාසයක වීමෙන් මේ පිළිබඳ අමාත්‍යාංශයේ අධීක්ෂණ කටයුතු නිසියාකාරව සිදු වී නොමැති බව නිරීක්ෂණය විය. | ගබඩා 11ක් පූර්ණ වශයෙන් නිමකොට ලංකා සතොස ආයතනය වෙත ගබඩා 05 ක් කුලී පදනම මත ලබා දී ඇත. පෞද්ගලික අංශය වෙත ගබඩා දෙකක් බදු පදනම මත ලබා දී ඇත. මේ වන විට තවත් ගබඩා තුනක් ලංකා සතොස ආයතනය වෙත බදු දීමට යෝජිතව ඇති අතර ගබඩා දෙකක ඉදිකිරීම් කටයුතු 5% - 20% අතර ප්‍රමාණයක පවතී. | අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ව්‍යාපෘති සම්බන්ධ අධීක්ෂණ කාර්යය නිසි පරිදි කළ යුතුය. |
| (ii) තවද 2020 මාර්තු 18 දින වන විට ගබඩා 06 ක නවීකරණ කටයුතු අවසන් වී අනෙකුත් ගබඩා 07 හි නවීකරණ ප්‍රගතිය 2022 මැයි වන විට සියයට 5 ක සිට 95 ක් දක්වා අතර පරාසයක වන බව දැක්වීම නිසා අමාත්‍යාංශය විසින් සංස්ථාව වෙත ප්‍රතිපූර්ණය කලයුතු රු. 20,035,264 ක මුදල 2023 අප්‍රේල් මස නැවත භාණ්ඩාගාරයට යවා තිබිණි. මෙහි ප්‍රගතිය පිළිබඳ සමාලෝචනයක් හෝ ඒ පිළිබඳ පූර්ණ වාර්තාවක් අමාත්‍යාංශය ලබාගෙන නොතිබුණි. | ගබඩා 11ක් පූර්ණ වශයෙන් නිමකොට ලංකා සතොස ආයතනය වෙත ගබඩා 05 ක් කුලී පදනම මත ලබා දී ඇත. පෞද්ගලික අංශය වෙත ගබඩා දෙකක් බදු පදනම මත ලබා දී ඇත. මේ වන විට තවත් ගබඩා තුනක් ලංකා සතොස ආයතනය වෙත බදු දීමට යෝජිතව ඇති අතර ගබඩා දෙකක ඉදිකිරීම් කටයුතු 5% - 20% අතර ප්‍රමාණයක පවතී. | අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ව්‍යාපෘති සම්බන්ධ අධීක්ෂණ කාර්යය නිසි පරිදි කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව (සමාගම) විසින් මඩකලපුවේ ඉදිකරමින් පවතින රජවාස ලංකා සතොස මෙගා අලෙවිසැල ඉදිකිරීමේ ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. 47,725,462 ක් වූ අතර මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 වන විට රු. 22,924,908 ක මුදලක් අමාත්‍යාංශය විසින් ලබා දී තිබූ අතර ගිවිසුම අනුව 2021 දෙසැම්බර් 06 දින වන | මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 වන විට රු. 22,924,908 ක මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අතර වර්තමානයේ රජයේ වියදමකින් තොරව ලංකා සතොස ආයතනය වෙත බදු පදනමින් ලබා දී ඇත. | එම |

විට ඉදිකිරීම නිමවිය යුතු වුවත් 2023 මැයි වන විටත් එම කටයුතු සම්පූර්ණ වී නොතිබුණි.

### 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | | | - |
| (අ) | 2021 සැප්තැම්බර් 28 දිනැති අංක අමප/21/1543/313/053 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් වෙනත් අමාත්‍යාංශ හා ආයතනවලට අයත් දැනට අමාත්‍යාංශය විසින් පරිහරණය කරනු ලබන වාහන අමාත්‍යාංශය වෙත විධිමත්ව පවරා ගැනීම සඳහා අනුමැතිය ලැබී තිබුණද 2023 මාර්තු 15 දින වන විටත් අමාත්‍යාංශය විසින් පරිහරණය කරනු ලබන වාහන 28 න් වෙනත් රාජ්‍ය ආයතන නමින් ලියාපදිංචි කර තිබුණු වාහන 15 ක් අමාත්‍යාංශය වෙත පවරාගෙන නොතිබුණි. | වාහන පවරා ගැනීම ක්‍රියාමාර්ග ගෙන ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණ අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | අමාත්‍යාංශය විසින් භාවිතා කරන ලද වාහන 03 ක් මාස 05 සිට වසරක කාල පරාසයක් තුල අලුත්වැඩියාව සඳහා නියෝජිත ආයතන හා ගරාජ වෙත යවා තිබූ අතර තවත් වාහනයක් වර්ෂයක කාලයක සිට අමාත්‍යාංශ භූමියේ ගාල්කර තිබුණි. | රාජ්‍ය වියදම් කළමණාකරණය යටතේ අත්‍යාවශ්‍ය අලුත්වැඩියා කටයුතු සිදු කර ඇත. | වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 හි 02 (ආ) මගින් ලබා දී ඇති උපදෙස් පරිදි අළුත්වැඩියා කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම කඩිනමින් සිදු කළ යුතුය. |
| (ඇ) | 2022 මැයි 09 වන දින රටතුල ඇති වූ කලහකාරී තත්ත්වය මත අමාත්‍යාංශයේ රු 64,490,000 ක් වටිනාකමකින් යුතු වාහන 03 ක් ගිනිගෙන සම්පූර්ණයෙන් විනාශ වී ගොස් තිබූ අතර එම වාහන සඳහා කැරලි කෝලාහල රක්ෂණය ලබාගෙන තිබුණද රක්ෂණ වන්දි මේ දක්වාත් ලබාගෙන නොතිබුණි. | එක් රථයක රක්ෂණාවරණ කටයුතු සිදු කර ඇත. මෝටර් රථ 03 ක් සඳහා රක්ෂණාවරණ කටයුතු යාවත්කාලීන කරමින් පවතී. | අදාල රක්ෂණ වන්දි ලබාගෙන වාහන අලුත්වැඩියා වලට යොමුකළ යුතුය. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉලක්ක 01 යටතේ තිරසාර ආර්ථික වර්ධනයක් ඇති කිරීම තුලින් සහනදායී මිල ක්‍රමයක් තුලින් දරිද්‍රතාවය අවම කිරීමේ අරමුණින් දේශීය නිෂ්පාදකයින් සහ ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා වූ සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත ණය ලබාදීමට සමාලෝචිත වර්ෂයේ ලබාදුන් රු. මිලියන 20 ප්‍රතිපාදන 100% ක් ඉතිරි වී තිබුණි. ඒ පිළිබද අවශ්‍ය මහපෙන්වීමේ කටයුතු හා අධීක්ෂණය කටයුතු නිසි ලෙස ඉටු නොවීම නිසා තිරසර සංවර්ධන අරමුණු අරමුණු ඉටුකර ගැනීමේ ප්‍රගතිය 50% කට අඩු මට්ටමක පැවතිණි. | සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන්ට ණය පහසුකම් ලබාදීම සඳහා 2021 වර්ෂයේ රු.මිලියන 100 ක් වෙන් වූ අතර එම රු. මිලියන 100 ක මුදල අදාළ පළාත් සමුපකාර කොමසාරිස්වරුන්ගේ අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිති වෙත ලබා දෙන ලදී. 2022 වර්ෂයේ රු. මිලියන 30 ක මුදලක් ගම්පහ දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතියේ ඉල්ලීමට අනුව ලබා දෙන ලදී. වෙනත් ඉල්ලීම් නොමැති වූ බැවින් රු.මි. 20 ක මුදලක් ඉතිරි වීම සිදුවී ඇත. | තිරසාර සංවර්ධන ඉලක්කයන් ඉටුකර ගත යුතුය. |
| (ආ) | ඉලක්ක 02 යටතේ ආහාර හිඟයක් ඇති නොවන ලෙස ආහාර සංචිත පවත්වා ගැනීම අධීක්ෂණය කිරීම යටතේ ආහාර ආරක්ෂිත සංචිත පවත්වා ගැනීම, පවත්වාගනු ලබන ආරක්ෂිත සහල් තොග සඳහා සමාලෝචිත වර්ෂයේ මිලියන 50 ක ප්‍රතිපාදන ද ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත සපයා තිබුණද 2022 දෙසැම්බර් 31 දින දක්වා එම ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. එම නිසා ඉලක්කයන්ගෙන්ද තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය. | සාර්ක් කලාපීය රටක් වශයෙන් වාර්ෂිකව සහල් මෙට්‍රික් ටොන් 8000ක සංචිතයක් පවත්වා ගත යුතු බවට තීරණයක් ඇත. ඒ අනුව 2022 වර්ෂයේ රු. මි. 824 ක් ප්‍රතිපාදන ඉල්ලුම් කළද ප්‍රතිපාදන ලෙස ලබා දී ඇත්තේ රු.මිලියන 50 කි. ඒ අනුව මෙට්‍රික් ටොන් 8000 ක ආරක්ෂිත සහල් තොගයක් පවත්වා ගැනීම සඳහා රු.මිලියන 50 ක මුදල කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බැවින්, එම ප්‍රතිපාදන භාවිතයට ගෙන නොමැත. | ඉලක්ක දැක්වීමේදී ඉටු කර ගැනීමට පවතින බාධාවන් පිළිබඳ අධ්‍යනය කර ඒ සම්බන්ධයෙන්ද අවධානය යොමු කළ යුතුය. |

## 5. යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 දෙසැම්බර් 24 දිනැති අංක DMA/01-2019(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව සෑම වර්ෂයකම දෙසැම්බර් 15 දිනට පෙර ඉදිරි වර්ෂය සඳහා වන අභ්‍යන්තර විගණන සැලැස්ම අවදානම් පාදක අභ්‍යන්තර සැලැස්මක් ලෙස සකස් කර එහි පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව හා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද 2022 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැස්ම එසේ ඉදිරිපත් කර නොතිබුණි. තවද එම සැලැස්ම විගණන හා කළමනාකරණ කමිටුවේදී අනුමත කරගෙනද නොතිබුණි. | 2022 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැස්ම 2022.01.27 දින එවකට සිටි ලේකම්තුමා විසින් අනුමත කර ඇති අතර එම සැලැස්ම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී අනුමත කරවා ගැනීම හෝ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සිදු වී නොමැත. ජාතික විගණන කාර්යාලය වෙත ප්‍රමාදයකින් යුතුව යොමු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර විගණන හා කළමනාකරණ කමිටුවේදී අනුමත කරගෙන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |